සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# තෙවන වාර පරීක්ෂණය 2019

**10 ශ්‍රේණිය** **ඉතිහාසය - I** **කාලය පැය 01 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

සැලකිය යුතුයි :
- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 දක්වා ප්‍රශ්නවලට දී ඇති (i), (ii), (iii) සහ (iv) පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

---

01. ශ්‍රී ලංකාවේ ශාසනික ඉතිහාසය හැදෑරීමේ දී වැදගත්වන සාහිත්‍ය මූලාශ්‍රය කුමක් ද?
(1) රාජාවලිය (2) නිකාය සංග්‍රහය (3) ධර්ම ප්‍රදීපිකාව (4) සද්ධර්ම රත්නාවලිය

02. අපේ පුරාවස්තු රැකගැනීම වඩාත් වැදගත් වන්නේ ඇයි?
(1) අතීතයට අයත්වන නිසාය.
(2) මිල කළ නොහැකි දේවල් නිසාය.
(3) දේශීය උරුමය ප්‍රදර්ශනය කිරීමට හේතුවන නිසාය.
(4) විදේශ සංචාරකයින්ට පෙන්විය හැකි නිසාය.

03. පුරාණ කාලයට අයත් සාහිත්‍ය, ආගමික, තොරතුරු හා වංශකථා ලියවී ඇත්තේ,
(1) පුස්කොළපොත්වලය. (2) ගල්පුවරු මතය. (3) කටාරම්වලය. (4) රන් සහ තඹපත්වලය.

04. පහත දැක්වෙන පුද්ගලයන් අතුරෙන් ශ්‍රී ලංකාවට පැමිණ තොරතුරු අධ්‍යයනය කොට වාර්තා සැකසූ පුද්ගලයින් දැක්වෙන පිළිතුර තෝරන්න.
A - මෙගස්තිනීස් B - ෆාහියන් හිමි C - ටොලමි
D - ඉබන් බතුතා E - රොබට් නොක්ස් F - හියුං සියැං
(1) B, D හා F (2) C, D හා E (3) B, D හා E (4) A, B හා D

05. ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික ජනාවාස අතර කඳුකර එළිමහන් දඩයම් ස්ථානය දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) සීගිරිය (2) අලිගල (3) බණ්ඩාරවෙල (4) බූන්දල

06. ගල්යුගයට අයත් ප්‍රජාව ජීවත් වූ පරිසර කලාප තීරණය කිරීමේදී ප්‍රධාන වශයෙන් සැලකිල්ලට යොමු වූ සාධකය වන්නේ,
(1) පරිභෝජනයේ හා තාක්ෂණයේ වෙනස්කම් ය.
(2) වාර්ෂික වර්ෂාපතනයේ වෙනස්කම් ය.
(3) සතුන් හා ප්‍රජාව කෙරෙහි ඇතිකරන බලපෑම් ය.
(4) ආහාර රටාව හා ඇඳුම් පැළඳුම් වල වෙනස්කම් ය.

07. පහත දැක්වෙන කරුණු අතුරෙන් පූර්ව ඓතිහාසික යුගය හා සම්බන්ධ ප්‍රකාශ ඇතුළත් පිළිතුර කුමක් ද?
A - ක්ෂුද්‍ර ගල්මෙවලම් වැඩි වශයෙන් භාවිත වීම. B - පිලිස්සූ මැටි වළං භාවිත කිරීම.
C - සංචාරක එඬේර ජීවිත ගත කිරීම. D - ක්‍රමවත් සුසාන චාරිත්‍ර විධි අනුගමනය කිරීම.
(1) B හා D (2) B හා C (3) D හා A (4) D හා C

08. ශ්‍රී ලංකාවේ මුල් ඓතිහාසික යුගයේ ජනාවාස ව්‍යාප්තිය ගංගා නිම්නවලින් පිටත ප්‍රදේශවල සිදුවූ බව නූතන පුරාවිද්‍යාඥයන්ගේ මතය වී තිබේ. ඒ බව සනාථ කෙරෙන ගංගා නිම්නයක් වන්නේ,
(1) ගල් ඔය (2) කිරිඳි ඔය (3) මල්වතු ඔය (4) යාන්ඔය

09. විමධ්‍යගත පාලන බලය බුක්ති විඳිමින් සිටි පරුමකවරුන් මධ්‍යගත පාලනයට සම්බන්ධ කර ගනිමින් කේන්ද්‍රීය රාජ්‍ය පාලනයක් ඇති කළ රජතුමා කවුද?
(1) 1 වන විජයබාහු රජු ය. (2) පණ්ඩුකාභය රජු ය.
(3) දේවානම්පියතිස්ස රජු ය. (4) දුටුගැමුණු රජු ය.

10. එක්තරා ගෘහපතියකු විසින් භික්ෂූන් වහන්සේලා වෙනුවෙන් ගල්ගුහාවක් පූජා කළ බව සඳහන් වන්නේ,

(1) පෙරියපුලියන්කුලම සෙල්ලිපියෙහි ය. (2) කළුදිය පොකුණ සෙල්ලිපියෙහි ය.

(3) කොත්ගල්කන්දේ සෙල්ලිපියෙහි ය. (4) මිහින්තලා සෙල්ලිපියෙහි ය.

11. ශ්‍රී ලංකාවේ දේශපාලන බලය මධ්‍යගත වීමෙන් පසුව රාජ්‍ය පරිපාලන ව්‍යුහයේ අනුපිළිවෙල දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) මහරජ, මහ ඇමති, භාණ්ඩාගාරික (2) මහරජ, ඇමති, මහ ඇමති

(3) මහරජ, භාණ්ඩාගාරික, මහ ඇමති (4) මහරජ, නගරගුත්තික, ඇමති

12. පහත සඳහන් රාජ නිලධාරීන් හා කාර්යයන් නිවැරදිව ගැළපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.


| | |
|---|---|
| 1. රූප අදෙක | A - රාජ්‍ය ලේඛනාගාරය භාරව කටයුතු කිරීම. |
| 2. පන අදෙක | B - කාසි අච්චු ගැසීමේ ප්‍රධානියා |
| 3. කනපෙඩික | C - වෙළඳ කටයුතු භාර ප්‍රධානියා |

(1) BAC (2) ABC (3) CBA (4) BCA

13. මුතුගල්ල නම් ස්ථානයෙන් හමුවූ සෙල්ලිපියට අනුව මජ්ජිම යනුවෙන් හැඳින්වූයේ කුමන වෘත්තිකයෙක් ද?

(1) කම්මල් කරුවෙකි (2) ගොවියෙකි (3) ධීවරයෙකි (4) වෙළෙන්දෙකි

- **යාබද සිතියම ඇසුරෙන් 14 - 15 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**




14. ශ්‍රී දන්තධාතුව රැගෙන හෙමමාලා හා දන්ත කුමරු ගොඩබට නැගෙනහිර වෙරළේ පිහිටි ලංකා පටුන දැක්වෙන අක්ෂරය කුමක් ද?

(1) B

(2) C

(3) A

(4) D

15. අන්තර් ජාතික වෙළඳාමේ දී වැදගත් වූ මහාතිත්ථ වරාය දැක්වෙන අක්ෂරය කුමක් ද?

(1) B

(2) D

(3) C

(4) A

16. හම්බන්තොට දිස්ත්‍රික්කයේ වෙහෙරකෙම නම් ස්ථානයේ තිබෙන සෙල්ලිපියෙහි 'තතවය' යනුවෙන් දක්වා ඇත්තේ,

(1) මැණික් ඔපකරන්නා (2) රෙදි මසන්නා (3) නූල් කටින්නා (4) වළං සාදන්නා

17. ක්‍රිස්තු පූර්ව දෙවන සියවසට අයත් සෙල්ලිපියක ''අඩික'' නම් නිලධාරියකු ගැන සඳහන් වේ. ඔහු වාරිකර්මාන්තය සම්බන්ධව කුමන ඉදිකිරීමක් කළ අයෙක් ද?

(1) වැව (2) අමුණු (3) සොරොව්ව (4) ඇළ මාර්ග

18. ලංකා ඉතිහාසයේ පළමුවරට ඔයක් හරහා අමුණක් තැනූ පාලකයා වශයෙන් සැලකෙනුයේ,

(1) වසභ රජු ය. (2) මහසෙන් රජු ය. (3) පළමුවන් අග්බෝ රජු ය. (4) ඉළනාග රජු ය.

19. විශාල බරක් දැරිය හැකිවන සේ ඉදිකළ වාස්තු විද්‍යාත්මක නිර්මාණවල දී නූතන කොන්ක්‍රීට් තාක්ෂණයට සමාන ක්‍රමයක් අනුගමනය කළ බවට සාධක ලැබෙන්නේ,

(1) රුවන්මැලිසෑයේ අත්තිවාරමේ ය. (2) මල්වතු ඔයේ ගල්පාලමේ ය.

(3) මාදුරු ඔයේ සොරෙව්වේ ය. (4) සීගිරි මහ වැව් බැම්මේ ය.

20. සීගිරි නගර සංකීර්ණයේ දක්නට ලැබෙන විශේෂත්වය වන්නේ,
   (1) නගරයේ ආරක්ෂාව සඳහා වැඩි අවධානයක් යොමු කිරීම.
   (2) ආගමික සිද්ධස්ථාන සඳහා නගරය තුළ ඉඩකඩ වෙන් කිරීම.
   (3) පරිසරය රැකෙන පරිදි නගරය සැලසුම් කර තිබීම.
   (4) කලා නිර්මාණ සඳහා ප්‍රමුඛත්වය ලබා දී තිබීම.

21. සෙල්ලිපිවල සඳහන් වන රද්කොල් සම්දරු යන රජුට සමීප නාලධාරියා හැඳින්වීමට මහනුවර යුගය වනවිට භාවිත වූ යෙදුම කුමක් ද?
   (1) වානිජ (2) රදල (3) රජ (4) පරුමක

22. පොළොන්නරු යුගයේ දී 'ගාවුතකණු' භාවිත කර ඇත්තේ,
   (1) මහා මාර්ගවල දුර දැක්වීමට ය. (2) රාජ්‍ය අයිතිය දැක්වීමට ය.
   (3) ඇළ මාර්ගවල දුර දැක්වීමට ය. (4) අභයභූමිවල සීමා දැක්වීමට ය.

23. මොහොල, දියකැට පහන යන අංග ඇතුළත් වන්නේ වැවක නිර්මාණය කර ඇති කුමන අංගයේ ද?
   (1) සලපනාව (2) සොරොව්ව (3) ඇළමාර්ග (4) බිසෝකොටුව

24. අතීත වාස්තු විද්‍යාත්මක නිර්මාණවල දී අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳව විශේෂ සැලකිල්ලක් දක්වා ඇති බවට හොඳ නිදසුනක් වන්නේ,
   (1) සීගිරි රජ මාළිගයයි. (2) ආලාහන පිරිවෙනයි.
   (3) මිහින්තලා දාන ශාලාවයි. (4) මැදිරිගිරිය වටදාගෙයයි.

25. පොළොන්නරු රාජධානිය පරිහානියෙන් පසු පිහිටුවාගත් ආරක්ෂිත ස්ථාන හා ඊට අදාළ පුද්ගලයින් පහත I හා II තීරුවල දැක්වේ.

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. යාපහුව | A - විජයබාහු |
| 2. ගෝවින්දමලයි | B - සංඛ සෙනෙවි |
| 3. ගංදෙණිය | C - සුබසෙනෙවි |
| 4. දඹදෙණිය | D - බුවනෙකබාහු ආදිපාද |

I හා II තීරු පිළිවෙලින් ගැළපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.
   (1) ABCD (2) CBAD (3) CDBA (4) DCBA

26. පහත A, B, C හා D යටතේ දැක්වෙන ඓතිහාසික සිදුවීම අතුරෙන් යාපහුව රාජ්‍ය සමයේ ජීවත් වූ අයෙකුට දැනගන්නට නොලැබෙන සිදුවීම් ඇතුළත් පිළිතුර කුමක් ද?
   A - ඉබන් බතුතා නම් අරාබි සංචාරකයා ශ්‍රී ලංකාවට පැමිණීම.
   B - රුවන්මැලි චෛත්‍ය ගොඩනැංවීම.
   C - පළමුවන කාශ්‍යප රජු සීගිරිය තම පාලන මධ්‍යස්ථානය ලෙස තෝරා ගැනීම.
   D - සපුමල් කුමරා කලක් යාපනය පාලනය කිරීම.
   (1) A හා B (2) A හා D (3) B හා D (4) C හා D

27. කාලිංගරායර් හා චෝඩගංග යන දකුණු ඉන්දියානු ආක්‍රමණිකයන් පැමිණියේ කුමන රාජධානි සමයේ ද?
   (1) දඹදෙනි (2) යාපහුව (3) කෝට්ටේ (4) කුරුණෑගල

28. කෝට්ටේ බලකොටුවක් නිර්මාණය කිරීම, ගම්පොළ තුන්වැනි වික්‍රමබාහු රජුගේ අගමැති ලෙස කටයුතු කිරීම, යාපනයේ ආර්යචක්‍රවර්තී රජුගේ බදු නිලධාරීන්ට එරෙහිව කටයුතු කිරීම, ඉහත සඳහන් ඓතිහාසික සිදුවීම් හා සම්බන්ධ පුද්ගලයා වූයේ,
   (1) සපුමල් කුමරු ය. (2) අම්බුලුගල කුමරු ය.
   (3) සේනාලංකාධිකාර සෙනෙවිය. (4) නිශ්ශංක අලකේශ්වර ය.

29. පළමුවන රාජසිංහ රජුට උඩරට ආක්‍රමණය කිරීමට උපකාර කළේ කවුද?
   (1) කරලියැද්දේ බංඩාර (2) වීරසුන්දර බංඩාර (3) කොනප්පු බංඩාර (4) යමසිංහ බංඩාර

30. නායක්කාර් වංශික රජවරු අනුපිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.
   (1) ශ්‍රී විජය රාජසිංහ, කීර්ති ශ්‍රී රාජසිංහ, රාජාධිරාජසිංහ, ශ්‍රී වික්‍රම රාජසිංහ
   (2) ශ්‍රී විජය රාජසිංහ, රාජාධිරාජසිංහ, කීර්ති ශ්‍රී රාජසිංහ, ශ්‍රී වික්‍රම රාජසිංහ
   (3) ශ්‍රී වික්‍රම රාජසිංහ, ශ්‍රී විජය රාජසිංහ, කීර්ති ශ්‍රී රාජසිංහ, රාජාධිරාජසිංහ
   (4) ශ්‍රී විජය රාජසිංහ, රාජාධිරාජසිංහ, ශ්‍රී වික්‍රම රාජසිංහ, කීර්ති ශ්‍රී රාජසිංහ

31. පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් උඩරට හා පෘතුගීසීන් අතර වූ සම්බන්ධතා පිළිබඳව සත්‍ය ප්‍රකාශ දෙක ඇතුළත් පිළිතුර කුමක් ද?

A - පෘතුගීසීහු උඩරට රජවරුන් සමඟ ලන්දේසීන් ට වඩා මිත්‍රශීලී පිළිවෙතක් අනුගමනය කළහ.

B - උඩරට ප්‍රදේශවල පාලන බලයක් ලබාගැනීමට පෘතුගීසීහු අසමත් වූහ.

C - උඩරට සමඟ පෘතුගීසී සබඳතාව ආක්‍රමණශීලී එකක් විය.

D - උඩරට ආක්‍රමණය කළ සෑම විටම පෘතුගීසීන්ට ජය හිමි විය.

(1) A හා B (2) B හා C (3) C හා D (4) D හා E

32. අලුත් රාජ්‍ය පෙළපතක් ආරම්භකොට මහනුවර රාජධානියට ශක්තිමත් පදනමක් දමන ලද්දේ,

(1) සේනා සම්මත වික්‍රමබාහු රජු ය. (2) පළමුවන විමලධර්මසූරිය රජු ය.

(3) දෙවන රාජසිංහ රජු ය. (4) කීර්ති ශ්‍රී රාජසිංහ රජු ය.



33. යාබද පින්තූරයේ දැක්වෙන සිතුවම අඳින ලද චිත්‍ර ශිල්පියා කවුද?

(1) මයිකල් ආංජිලෝ (2) ලියනාඩෝ ඩාවින්චි

(3) රාෆායෙල් (4) පෙට්‍රාක්

34. 15 වන සියවසේ දී නාවික විද්‍යාලයක් ආරම්භ කර දේශ ගවේෂණවලට විශාල උදව්වක් කළ නාවික හෙන්රි කුමන ජාතිකයෙක් ද?

(1) ඕලන්ද (2) පෘතුගීසි (3) බ්‍රිතාන්‍ය (4) ප්‍රංශ

- **පහත ABCD වලින් දැක්වෙන ප්‍රකාශ යුගල අධ්‍යයනය කර 35 හා 36 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

A - 1. නාවුක හෙන්රි
2. දේශගවේෂණය

B - 1. කොන්ස්තන්තිනෝපලය තුර්කීන් අල්ලා ගැනීම
2. පුනරුදය ඇරඹීම

C - 1. විශ්වය පිළිබඳ නව සොයාගැනීම්
2. විද්‍යාවේ දියුණුව

D - 1. ලෝකය ගෝලාකාර බව
2. ගුරුත්වාකර්ෂණය

35. දෙවැන්න ක්‍රියාත්මක වීම සඳහා පළමුවැන්නේ අනුග්‍රහය පෙන්වන ප්‍රකාශ යුගලය කුමක් ද?

(1) A (2) B (3) C (4) D

36. පළමුවැන්න දෙවැන්නේ වර්ධනයට හේතුවන බව දැක්වෙන ප්‍රකාශ යුගලය කුමක් ද?

(1) A (2) B (3) C (4) D

37. ක්‍රි.ව. 1602 දී පළමුවන විමලධර්මසූරිය රජු හමුවීමට පැමිණි පළමු ලන්දේසි දූතයා වන්නේ,

(1) ෆන් එංගල්බෙක් (2) ජොරිස් වැන් ස්පිල්බර්ජන්

(3) ෆන් හුන්ස් (4) වෙස්ටර් වෝල්ට්

38. මුල්ලේරියා සටනින් පෘතුගීසීන් අන්ත පරාජයට පත්කිරීමට සීතාවක රජවරු සමත් වුවද ඔවුන් ලංකාවෙන් පන්නා දැමීමට නොහැකි වූ ප්‍රධාන හේතුව වූයේ කුමක් ද?

(1) සිංහල රජවරුන්ට ප්‍රබල නාවුක බලයක් නොසිටීමයි.

(2) පුහුණු කරන ලද ප්‍රමාණවත් හමුදාවක් සිංහල රජවරුන්ට නොසිටීමයි.

(3) සිංහල හමුදා සේනාපතිවරුන් අතර පැවති අසමගිකමයි.

(4) උඩරට පාලකයන්ගෙන් සහායක් නොලැබීමය.

39. පහත 'අ' තීරුවේ සඳහන් වන සටන් 'ආ' තීරුවේ ඇති පෘතුගීසි නායකයන්ට අදාළව නිවැරදි ව ගළපා ඇති පිළිතුර තෝරන්න.

| 'අ' තීරුව | 'ආ' තීරුව |
|---|---|
| 1. දන්තුරේ | A - කොන්ස්තන්තීනු ද සා. |
| 2. රන්දෙණිවල | B - දියෝගෝ ද මේලෝ. |
| 3. ගන්නෝරුව | C - පේරෝ ලෝපේස් ද සූසා. |
| 4. බලන | D - අපොන්සු පෙරෙයිරා ද ලසර්දා. |
| | E - ජෙරනිමෝ ද අසවේදු |

(1) CABE (2) CBDA (3) DABE (4) EBCD

40. 1521 දී ඇති වූ විජයබා කොල්ලයෙන් පසුව කෝට්ටේ රාජධානිය බෙදී ගිය රාජ්‍ය තුන අයත් පිළිතුර තෝරන්න.

(1) කෝට්ටේ, සීතාවක, මහනුවර (2) සීතාවක, කෝට්ටේ, යාපනය

(3) මහනුවර, යාපනය, සීතාවක (4) කෝට්ටේ, සීතාවක, රයිගම

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# තෙවන වාර පරීක්ෂණය 2019

**10 ශ්‍රේණිය** **ඉතිහාසය - II** **කාලය පැය 03 යි.**

නම/ විභාග අංකයඃ

- පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- **II** කොටසින් ප්‍රශ්න 4 ක් ද, **III** කොටසින් එක් ප්‍රශ්නයක් ද තෝරාගෙන පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.

## I - කොටස

(01) (අ) පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ද, (ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලෝක සිතියමෙහි ද ලකුණු කොට නම් කරන්න.

(i) බලන, පතිරාජවෙල, කිරිඳි ඔය, ජජ්ජරනදිය, ගම්පොල, මාගම, කාලතිත්ථ, හුරුළුවැව, යාපහුව, පොම්පරිප්පුව, සොරබොරවැව, යාපනය (ල.12)

(ii) මලක්කා සමුද්‍ර සන්ධිය, සින්දු නදිය, මදුරාසිය, මියන්මාරය, පෘතුගාලය, බ්‍රිතාන්‍ය ද්වීපත් (ල.06)

(ආ) (i) පහත ABCD යටතේ දක්වා ඇති ප්‍රකාශ වලට අදාළ වන පිළිතුරු ලියන්න.

A මහාවංශය රචනා කළ මහානාම හිමි වැඩ විසූ පිරිවෙන.

B එදා හෙළදිව නම් කෘතිය රචනා කළ ඉංග්‍රීසි ජාතිකයා.

C ශ්‍රීමහා බෝධීන් වහන්සේ වැඩම කළ උතුරු වෙරළේ පිහිටි වරාය.

D මුද්‍රණ යන්ත්‍රය සොයාගත් ජර්මන් ජාතිකයා. (ල. 04)

- A හා B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු අංක අනුපිළිවෙලින් ලියන්න.

(ii) 1. පින්තූරයේ දක්වෙන්නේ කුමන රජතුමාගේ පිළිරුවද.

2. මෙම ප්‍රතිමාව දක්නට ලැබෙන ස්ථානය කුමක් ද?

3. එතුමා රුවන්වැලි සෑය අලංකාරය කිරීමට යෙදූ උපක්‍රමයක් ලියන්න.

4. එතුමා රතු පබළු ගෙන් වූ රට, (ල.04)



A

(iii) 1. පින්තූරයේ දැක්වෙන ස්තූපය කුමක් ද?

2. මෙය ඉදිකළ රජතුමා කවුද?

3. මෙහි නිදන් කළ පූජනීය වස්තුව කුමක් ද?

4. මෙම ස්තූපය දක්නට ලැබෙන්නේ කුමන පූජා භූමියේ ද? (ල.04)



B

## II - කොටස

(02) (i) ලංකා ඉතිහාසය හැදෑරීමේ දී උදව්කරගත හැකි පහත ක්ෂේත්‍ර වලට අදාල කෘති 03 ක් නම් කරන්න. (ල.03)

A - සන්දේශ කාව්‍යයක්

B - ප්‍රශස්ති කාව්‍යයක්

C - හටන් කාව්‍යයක්

(ii) තමන් නොදුටු එහෙත් වෙනත් අය විසින් පවසන ලද තොරතුරු පදනම් කරගෙන ශ්‍රී ලංකාව පිළිබඳ වාර්තා තැබූ විදේශීය වාර්තාකරුවන් 04 දෙනෙක් පහත දැක්වේ. ඔවුන්ට අදාල රටවල් ඉදිරියෙන් ලියා දක්වන්න. (ල.04)

A - ඇරිස්ටෝටල්

B - ප්ලිනි

C - හියුං සියැං

D - පර්නාඩ් ඕ ක්වේරෝස්

(iii) මෙරට භාවිත වූ පැරණිම කාසියත්, පොළොන්නරු යුගයේ භාවිතා වූ කාසියත් නම් කර කාසි වලින් ඉතිහාසය පිළිබඳව දැකගත හැකි තොරතුරු පිළිබඳව විස්තර කරන්න. (ල.05)

(iv) ඉතිහාසය හැදෑරීමෙන් ලැබෙන ප්‍රයෝජන 03 ක් දක්වා එම ප්‍රයෝජන අතීතයට මෙන්ම වර්තමානයට ද වැදගත් වන ආකාරය පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.06)

(03) (i) ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත් වූ පහත සඳහන් එළිමහන් වාසස්ථාන 03 ට අයත් වන ස්ථාන 03 ක් නම් කරන්න. (ල.03)

A - වෙරළාශ්‍රිත එළිමහන් වාසස්ථාන

B - තෙත් කලාපීය එළිමහන් වාසස්ථාන

C - කඳුකර එළිමහන් දඩයම් වාසස්ථාන

(ii) පූර්ව ඓතිහාසික යුගයේ තාක්ෂණික දියුණුව ඇති වූ ක්ෂේත්‍ර 04 ක් නම් කරන්න. (ල.04)

(iii) ප්‍රාග් ඓතිහාසික යුගයේ අභිචාර විධින් පවත්වන ලද ස්ථාන 02 ක් නම්කර එම ස්ථානවල අභිචාරවිධි පවත්වන ලද ආකාරය විස්තර කරන්න. (ල.05)

(iv) මුල් ඓතිහාසික යුගයේ බිහි වූ ජනාවාස වර්ග 03 ක් නම් කර ඒ පිළිබඳ කෙටියෙන් පැහැදිලි කිරීමක් කරන්න. (ල.06)

(04) (i) පැරණි සමාජයේ ගමිකයන් ඉටුකළ කාර්යයන් 03 ක් නම් කරන්න. (ල.03)

(ii) පහත A, B, C, D වලින් දක්වා ඇති ප්‍රකාශ වලට අදාළ පිළිතුරු වරහන් තුළින් තෝරා ලියන්න. (ල.04)

A - වැව් කීපයක් ඇළ මාර්ගවලින් සම්බන්ධ කළ වැව් පද්ධතිය -

B - ප්‍රාචීන රජ හෙවත් නැගෙනහිර ප්‍රදේශය භාර රජු හැඳින්වූ නම -

C - තොටුපලෙන් අයබදු ලබාගෙන දේපල බුක්ති විඳි තැනැත්තා -

D - ප්‍රාදේශීය පාලනය හිමි කාන්තාව හැඳින්වූ නම -

(පොචනි රජ, කොතුරුගැනා, තොටබොජක, එල්ලංගාව, පරුමකලු)

(iii) බලය මධ්‍යගතකිරීමේ ක්‍රියාවලියේදී වැදගත් කාර්යභාරයක් ඉටුකළ රජවරු දෙදෙනක් ලෙස දුටුගැමුණු රජුගෙන් හා වසභ රජුගෙන් ඉටු වූ කාර්යයන් 02 ක් පැහැදිලි කරන්න. (ල.05)

(iv) දේශපාලන බලය මධ්‍යගත වීමේදී රජු බලසම්පන්න පුද්ගලයකු ලෙස පෙනී සිටීමට උත්සාහ දරා ඇත. එහිදී ඔහු විසින් ජනතාවට ඉටුවිය යුතු යුතුකම් තුනක් දක්වා තිබේ. එම යුතුකම් තුන නම්කර කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.06)

(05) (i) ශ්‍රී ලංකාවේ පහත සඳහන් කාර්යයන් ඉටුකරන පාලන ආයතන හැඳින්වූ ආකාරය එම පාලන ආයතනය ඉදිරියෙන් ලියා දක්වන්න. (ල.03)

A - ව්‍යවස්ථාදායක විධායක කටයුතු කළ ආයතනය -

B - අධිකරණ කටයුතු මෙහෙයවූ ආයතනය -

C - රජයේ සියලු කටයුතු ලේඛනගත කළ තැනැත්තා -

(ii) පරිපාලනයේදී රටේ ජනතාවගේ ශුභ සිද්ධිය සඳහා කටයුතු කිරීමට පාලකයෝ කටයුතු කළහ. පහත සඳහන් රජවරු ජනතා ශුභ සාධනයට කළ දේවල් මොනවාදැයි එම රජවරුන් ඉදිරියෙන් ලියා දක්වන්න. (ල.04)

A - බුද්ධදාස රජතුමා

B - පස්වන මහින්ද රජතුමා

C - හතරවන කාශ්‍යප රජතුමා

D - පළමුවන උපතිස්ස රජතුමා

(iii) අතීත සමාජයේ වෙළඳාම සිදු වූ ආකාර 02 ක් නම් කර ඒ පිළිබඳව කෙටි විස්තරයක් කරන්න. (ල.05)

(iv) අනුරපුරය නගරයක් ලෙස වර්ධනය වීමට බලපෑ හේතු තුනක් නම් කර පැහැදිලි කරන්න. (ල.06)

(06) (i) මහවැලි ඉදිකිරීම තුළින් ඉටුකර ගැනීමට බලාපොරොත්තු වූ බහුවිධ අවශ්‍යතා 03 ක් නම් කරන්න. (ල.03)

(ii) පුරාණ කාලයේ ඉදිකළ දවැන්ත ඇළ මාර්ගයක් වන්නේ මහවැලි ගඟේ අතු ගංගාවක් වූ අඹන් ගඟ හරස්කර ඉදිකළ ඇළහැර ඇළයි. ඒ මඟින් ජලය ලබාගත් වැව් 04 ක් සඳහන් කරන්න. (ල.04)

(iii) අතීත මැටි ඔරු සුසාන ඉදිකිරීමේදී විද්‍යාත්මක ක්‍රමවේදයන් භාවිතා කළ අවස්ථා 02 නම් කර පැහැදිලි කරන්න. (ල.05)

(iv) පැරණි මිනුම් ක්‍රම භාවිතයට ගත් අවස්ථා 03 ක් නම් කර කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.06)

(07) (i) අතීතයේ දී බදු නීතිය යටතේ අයකළ බදු වර්ග 03 ක් නම් කරන්න. (ල.03)

(ii) (අ) පහතින් දක්වා ඇති සිතියමේ AB වලින් දැක්වෙන්නේ වියළි කලාපීය රාජධානි මධ්‍යස්ථාන 02 කි. එය දක්වන්න. (ල.02)

(ආ) C හා D වලින් දැක්වෙන්නේ දෙවන නාගරීකරණයේදී බිහි වූ රාජධානි 02 කි. එම දෙක නම් කරන්න. (ල.02)

(iii) කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා රට පුරා බෞද්ධ ප්‍රබෝධයක් ඇතිකිරීමට කටයුතු කළේය. කරුණු 02 ක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල.05)

(iv) මහනුවර රාජධානියේ සමාජය සංවිධානය වූ ආකාරය එකල සමාජයේ පැවති අංග ලක්ෂණ 03 ක් ඇසුරින් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.06)




---

## III - කොටස

(08) (i) පුනරුද සමයේ පහතින් දක්වා ඇති රටවලින් බිහි වූ ගත් කතුවරු තිදෙනෙක් වරහන්තුළින් තෝරා නම් කරන්න. (ල.03)

A - ඉතාලිය

B - එංගලන්තය

C - ප්‍රංශය

(ඉරාස්මස්, සර් තෝමස් මුවර්, පෙට්රාක්)

(ii) පහත සඳහන් වන්නේ පුනරුද සමයේ විශ්වය පිළිබඳ මතවාද ඉදිරිපත් කළ විද්‍යාඥයන් 04 කි. ඔවුන් ඉදිරිපත් කළ මත ඉදිරියෙන් ලියා දක්වන්න. (ල.04)

A - පෝලන්ත ජාතික නිකලස් කොපර්නිකස්

B - එංගලන්ත ජාතික අයිසෙක් නිව්ටන්

C - ජර්මන් ජාතික ජොහැන්නස් කෙප්ලර්

D - ඉතාලි ජාතික ගැලීලියෝ ගැලීලි

(iii) පුනරුද සමයේ කලාශිල්ප ක්ෂේත්‍රයේ ඇති වූ වෙනස්කම්, චිත්‍ර කලාව හා ප්‍රතිමා කලාව ඇසුරින් විස්තර කරන්න. (ල.05)

(iv) පුනරුදය ලංකාවට බලපෑ ආකාරය ලංකාවේ ඇතිවූ දේශපාලන ආර්ථික සමාජ වෙනස්කම් ඇසුරින් පැහැදිලි කරන්න. (ල.06)

(09) (i) යුරෝපියන් ආසියාවට ඒමේ අරමුණු 03 ක් ලියන්න. (ල.03)

(ii) කොන්ස්තන්තිනෝපල් නගරය තුර්කීන් අල්ලා ගැනීම නිසා යුරෝපා ජාතීන්ට මුහුණපෑමට සිදු වූ ගැටළු 04 ක් නම් කරන්න. (ල.04)

(iii) ආසියාවට ඒමට වෙළඳමාර්ග සෙවීමේදී පෘතුගීසීන්ට වෙනත් ජාතීන්ට වඩා කාර්යක්ෂමව එය කිරීමට හැකි විය. කරුණු 02 ක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල.05)

(iv) අතීතයේ සිටම ආසියාව හා යුරෝපීය අතර වෙළඳ සම්බන්ධතා පැවැත්වූ වෙළඳ මාර්ග 03 ක් දක්වා ඒ ඔස්සේ වෙළඳාම් සිදු වූ ආකාරය පැහැදිලි කරන්න. (ල.06)

(01) (අ) (i) ප්‍රශ්නයට අදාළ ශ්‍රී ලංකා සිතියම



(01) (අ) (ii) ප්‍රශ්නයට අදාළ ලෝක සිතියම




**පිළිතුරු පත්‍රය - I කොටස**

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(2) | 2 -(3) | 3 -(1) | 4 -(3) | 5 -(3) | 6 -(2) | 7 -(1) | 8 -(2) | 9 -(4) | 10 -(1) |
| 11 -(1) | 12 -(4) | 13 -(1) | 14 -(3) | 15 -(2) | 16 -(3) | 17 -(4) | 18 -(4) | 19 -(1) | 20 -(3) |
| 21 -(2) | 22 -(1) | 23 -(2) | 24 -(2) | 25 -(3) | 26 -(2) | 27 -(2) | 28 -(4) | 29 -(2) | 30 -(1) |
| 31 -(2) | 32 -(2) | 33 -(3) | 34 -(2) | 35 -(1) | 36 -(3) | 37 -(2) | 38 -(1) | 39 -(1) | 40 -(4) |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

**II කොටස**

(01) (අ) (i)




(ii)



## I - කොටස

(01) (ආ) (i) A - අනුරපුරයේ දික්සඳ සෙනෙවි පිරිවෙන | B - රොබට් නොක්ස්
C - ජම්බුකෝළපට්ටන | D - ජොහැන්නස් ගුටෙන්බර්ග් (ල.04)

(ii) 1. භාතිකාභය | 2. රුවන්වැලි සෑයේ මළුවේ
3. රතු පබළු දැලක් එළීම | 4. රෝමය (ල.04)

(iii) 1. ථූපාරාමය | 2. දේවානම් පියතිස්ස
3. බුදුරජාණන් වහන්සේ ගේ දකුණු අකු ධාතුව | 4. අනුරපුරයේ මහමෙවුනා පූජා භූමියේ (ල.04)

## II - කොටස

(02) (i) A - මයුර, තිසර, සැලළිහිණි, පරෙවි ආදි සංදේශ කාව්‍යක් ආදී,

B - පැරකුම්බා සිරිත

C - සීතාවක සටන, කොන්ස්තන්තීනුද සා සටන ආදී, (ල.03)

(ii) A - ග්‍රීක B - රෝමය C - චීන D - පෘතුගීසි (ල.04)

(iii) පැරණිම කාසිය - කහාපණ / පොළොන්නරු කාසිය - තඹමස්ස / කාසිවලින් හෙළිකරගත හැකි තොරතුරු - රටේ ආර්ථිකය, වෙළඳාම, ලෝහ භාවිතය, තාක්‍ෂණය ආදී තොරතුරු දැනගත හැකිවීම. (ල.05)

(iv) ● තමා ජීවත්වන සමාජය හා ලෝකය පිළිබඳ යථාවබෝධය ● අතීත අත්දැකීම් මගින් වර්තමානය තේරුම් ගෙන අනාගතය ගොඩනැගීමට ● මනුෂ්‍යත්වයට ආදරය කිරීමෙන් ජාතික සමගිය ගොඩනැගීම ● අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරීමට පුරුදුවීම ● විවිධ මත ඉවසීමට පුරුදු වීම (ආදී කරුණු 03 ක් අතීතයට මෙන්ම වර්තමානයටද වැදගත්වන ආකාරයට විස්තර කරතිබීම හා අතීත ගැටළු වලට මුහුණ දුන් ආකාරය ආදර්ශයට ගෙන වර්තමාන ගැටළු විසඳීමට උත්සාහ දැරීම.) (ල.06)

(03) (i) A - මිනිහා ගල්කන්ද, බූන්දල, පතිරාජවෙල

B - බෙල්ලන් බැඳි පැලැස්ස

C - බණ්ඩාරවෙල, හෝර්ටන් තැන්න (ල.03)

(ii) ලෝහ තාක්‍ෂණය / මැටි තාක්‍ෂණය / නිවාස ඉදිකිරීමේ තාක්‍ෂණය / පබළු නිපදවීමේ තාක්‍ෂණය (ල.04)

(iii) බදුල්ලට නුදුරු රාවණ ඇල්ල ප්‍රදේශය :- දෙකට බෙදෙනසේ සිදුරු විදින ලද මිනිස් හිස් කබලක් හසුවීම හා එම හිස් කබලේ රළුවට පිහිටා තිබූ දාර ගලක උලා ඔප මට්ටම් කර පැත්තක ගුරුගල් ආලේප කිරීම. පාහියන්ගල ගුහාවෙන් ලැබෙන ශරීර කොටස්. මේවා දිරායන තුරු යම් තැනක වළලා දමා පසුව ඇට සැකිලි ගෙන නැවත තැන්පත් කිරීම. කුරුවිට බටදොඹලෙන - ඇටසැකිලි වකුටුකර වැලලීම. (ල.04)

(iv) වාපි ගාම, වෘත්තිකයන් විසුගම්, විවිධ කාර්යන් පදනම් කරගෙන බිහි වූ ගම්.

- වාපිගාම :- වැවක් මුල්කරගෙන බිහිවීම මහාවංශයේ සඳහන් ආකාරයට මෙම ගම් සුමනවාපි ගාම, විහාරවාපි ගාම, හුන්දරිවාපි ගාම, කඩහවාපී ගාම ලෙස නම් කර ඇත.
- වෘත්තිකයන් විසුගම් :- ජනතාව කරන ලද විවිධ වෘත්තීන් අනුව වෙන්කළ ගම් පැවතුනි. මේවා එකිනෙකින් ස්වාධීන වූ ගම් ලෙස පැවතී ඇත.
- විවිධ කාර්යන් පදනම් කරගෙන බිහි වූ ගම් :- වරාය ආශ්‍රිතව බිහි වූ ගම් පට්ටනගම් ලෙස හැඳින්වීම, නියම්ගම්, වෙළඳගම් ලෙස හැඳින්වීම ජනතාව අතහැර දැමූ ගම් ඔලගම් ලෙස හැඳින්වීම. (ල.06)

(04) (i) ගමට අයත් වැව නඩත්තු කිරීම / ජලය බෙදා හැරීම / ගම්වල ආරවුල් විසඳීම (ල.03)

(ii) A - එල්ලංගාව | B - පොචනි රජ
C - තොටබොජක | D - පරුමකලු (ල.04)

(iii)
- දුටුගැමුණු රජතුමා විවිධ දක්‍ෂතා ඇති පරුමුක වරුන්ගෙන් උදව්ගෙන එතෙක් විමධ්‍යගතව තිබූ බලය මධ්‍යගත කළේය. දිවයිනට එක්සේසත් කිරීමද මෙතුමා අතින් සිදුවිය.
- වසභ රජතුමාගේ කාලයේ මුළු ලංකාවම එක් ඒකකයක්ලෙස ක්‍රියාත්මක විය. සමස්ත ලංකාවම පරිපාලන දිස්ත්‍රික්ක වෙන්කොට ඒ එක් එක් දිස්ත්‍රික්ක පාලනයට ඇමතිවරුන් පත්කළේය. යාපනය පාලනය කිරීමට ඍෂිගිරිය නම් ඇමතියෙක් පත්කේළද මෙතුමාය. (ල.05)

(iv)
- රට ආර්ථික වශයෙන් දියුණු කිරීම : කෘෂිකාර්මික කටයුතු දියුණු කිරීම සඳහා වැව් අමුණු ඉදිකිරීම කර්මාන්ත හා වෙළඳාම දියුණු කිරීම බාහිර වෙළඳාම දියුණු කිරීමට වරායවල් සංවර්ධනය කිරීම දැක්විය හැක.

- රටවැසියාට ආරක්ෂාව සැපයීම : පරසතුරු උවදුරු වලදී ජනතාව ආරක්ෂා කිරීමට අවශ්‍ය සේනා ශක්තිය වැඩි දියුණු කිරීම.
- රටවැසියාගේ අධ්‍යාත්මික සංවර්ධනය ඇතිකිරීම මේ සඳහා වෙහෙර විහාර ඉදිකිරීම භික්ෂූන් වහන්සේලාට සිව්පසයෙන් උදව් කිරීම දැක්විය හැක. නිශ්ශංක මල්ල එළාර වැනි විදේශ සම්භවයක් ඇති රජවරුන් ඉහත ආකාරයට කටයුතු කිරීමෙන් ජනතා විශ්වාසය දිනාගෙන ඇත. (ල.06)

(05) (i) A - එක්තැන් සමිය B - සභාව C - මහලේ (ල.03)

(ii) A - රෝහල් ඉදිකිරීම

B - ලංකාවේ නොයෙක් ප්‍රදේශ වල පිහිටුවා තිබූ රෝහල් වලට අවශ්‍ය පහසුකම් සැලසීම.

C - උණ රෝගීන් සඳහා විශේෂ රෝහලක් ඉදිකිරීම (උපසග්ග රෝගනාස)

D - ගැබිනි මව්වරුන්ගේ අවශ්‍යතා සඳහා පසවත්ති නාම ශාලා, ආරෝග්‍යශාලා ඉදිකිරීම. (ල.04)

(iii) අභ්‍යන්තර වෙළඳාම / බාහිර වෙළඳාම

- අභ්‍යන්තර වෙළඳාම :- වෙළඳ නගර බිහිවීම අභ්‍යන්තර වෙළඳපලවල් තිබීම / වෙළෙන්දෝ සංවිධානය වී සිටියේය. එවැනි වෙළඳ සංවිධාන පුග ලෙස හැඳින්වේ. වෙළඳාමේ නියුක්ත පිරිස් වනිජ ලෙස හඳුන්වා තිබීම. වෙළඳපලවල් තිබීම, අනුරපුරයේ වෙළඳපලකට මාගම රට සුරනිමල නම් තැනැත්තකු සුවඳ විලවුන් ගැනීමට පැමිණි බව සාහිත්‍ය මූලාශ්‍ර වල සඳහන් වීම.
- ජාත්‍යන්තර වෙළඳාම් වලදී වලඤ්ඤයාර් හා නානාදේසි නම් වෙළඳ සංවිධාන පැවතීම. කාම්බෝජ වරුන්ගේ වෙළඳ සංවිධානද පිහිටා තිබුනි. වරාය වල පිහිටීමද ශ්‍රී ලංකාවේ මධ්‍යගත පිහිටීම ද ජාත්‍යන්තර වෙළඳාමට බලපෑ බව පෙනේ. (ල.05)

(iv)
- අන්තර් ජාතික වෙළඳාම
- නැගෙනහිර බටහිර පිහිටි ගෝකණ්ණ මාතොට වරායන්ගේ පිහිටීමත්
- කුඩා වරාය වල පිහිටීම : උතුරු වෙරළේ ජම්බුකෝල පට්ටන වරායෙන් ජයසිරිමා බෝධිය වැඩම කිරීමද, නැගෙනහිර වෙරළේ ලංකා පට්ටන වරායෙන් දන්ත ධාතුව රැගෙන හේමමාලා දන්ත කුමරුගේ පැමිණීම ද යන සිදුවීම් අනුරපුරය නගරයක් ලෙස වර්ධනය වීමට බලපෑවේය. (ල.06)

(06) (i)
- කෘෂිකාර්මික කටයුතු සාර්ථක කර ගැනීම.
- ගංවතුර පාලනය කිරීම.
- නාගරික ජනතාවගේ වෙනත් අවශ්‍යතා සම්පූර්ණ කිරීම. (ල.03)

(ii) මින්නේරිය / ගිරිතලේ / කවුඩුල්ල / කන්තලේ (ල.04)

(iii) අතීත මැටි ඔරු සුසාන ඉදිකිරීමේදී විද්‍යාත්මක ක්‍රමවේදයන් භාවිතා කළ අවස්ථා 02 ක් පහත දක්වේ.

- මැටි වර්ගය තෝරාගෙන ගර්භයේ බිත්ති අවට උසකින් හා එයට සරිලන ඝනකමකින් ද බිත්ති පොළොවට ලම්බාකාරව බැඳීම තුළින් සොහොන් බිත්ති වල සමබරතාවය රැකගැනීම. යම් වස්තුවක් පොළොවට ලම්බක වීමෙන් එම වස්තුව මගින් පොළොවට ඇතිකරන පීඩනය නිෂ්ක්‍රීය වනබව භෞතික විද්‍යා මූලධර්මයකි.
- එමෙන්ම සොහොන් ගර්භයක ඇටසැකිලි පිලිස්සීමේ දී ඇතුළට වායුව ලබා ගැනීම සඳහා මැටි නළයක් සවිකර තිබුනි. දහනය සඳහා ඔක්සිජන් වායුව අවශ්‍ය බව අතීත ශිල්පියා දැනසිටි ආකාරය මෙයින් පැහැදිලි වේ. (ල.05)

(iv)
- අවකාශය මැනීම :- ගොවිතැන් කටයුතු සඳහා ඉඩම් භාවිතයේ දී මේ ක්‍රමය භාවිතා කිරීම. මෙහිදී කිරිය අමු කරිසය පැල යන මිනුම් භාවිතා කිරීම.
- දිග මැනීම :- දිග මැනීමට ද ක්‍රමවත් මිම් පද්ධතියක් තිබිණි. එහි කුඩාම ඒකකය පරමාණුවයි. කෙටිදුර මැනීමට ආංගුලය හා වියත යන මිම් භාවිතා කිරීම ගොඩනැගිලි ඉදිකිරීමේදී හා පිළිම නෙලීමේදී කුඩා මිම් භාවිතා විය. දිගදුර මැනීමට යොදා ගත්තේ ගව්ව යොදුන උසබ යන මිනුමිය. (උදාහරණ : නිශ්ශංක මල්ල රජතුමා ගව්වෙන් ගව්වට ගල් කණු සිටුවීමට නියෝග කළේය.)
- බර මැනීම :- වෙළඳාමේදී භාණ්ඩවල බර නිවැරදිව මැනීම අවශ්‍ය විය. සොරබොර වැව ටැම් ලිපියේද රජය විසින් අනුමත කළ තරාදි පඩි කිරුම් මිනුම් සඳහා භාවිතා කිරීම දක්වා තිබුණි.
- කාලය මැනීම :- බීජ වැපිරීම හා අස්වැන්න නෙළීම ආදිය නියමිත කාලයට කිරීම සඳහා කාලය පිළිබඳ මිනුම් භාවිතා විය. මෙහිදී මාසය වස, තිථිය යන මිනුම් භාවිතා විය. මින් 03 ක් දැක්වීමට (ල.06)

(07) (i) දකපති / බොජකපති / මතරමජිබක (ල.03)

(ii) A - අනුරාධපුරය B - පොළොන්නරුව C - යාපහුව D - දඹදෙණිය (ල.04)

(iii) ● රජු සියම්දේශයට අයත් වන උපාලි හිමියන් ඇතුළු පිරිස ගෙන්වාගෙන සියම් නිකාය ආරම්භ කිරීම.

● උඩරට පහතරට විහාරාරාම ප්‍රතිසංස්කරණය කිරීම.

● වැලිවිට සංඝරාජ හිමියන්ට සංඝරාජ පදවිය පිරිනමා බෞද්ධ ප්‍රබෝධයක් ඇති කිරීම. (පිටු අංක 11) (ල.05)

(iv) ● ග්‍රාමීය සමාජයක් පැවතීම. ● ගම ස්වයංපෝෂිත එකක් වීම. ● සමාජ සම්බන්ධතා කුල ක්‍රමය මත සිදුවීම. ● ඒ ඒ කුල වලට වෙන් වූ ආර්ථික කටයුතු පැවතීම. ● ආවාහ විවාහ කුල පදනම් කරගෙන සිදුකිරීම. ● විවාහ ක්‍රම 03 ක් අනුගමනය කිරීම. ● සමාජයේ සියලු කටයුතු අත්කම් ක්‍රමයට සිදුවීම. ● පවුල ප්‍රධාන සමාජය ඒකකය වීම. ● සමාජයේ ගුණගරුක බව ප්‍රධාන අංක ලක්ෂණයක් වීම. ● පන්සල ගැමි ජීවිතය හා ..... පැවතීම. (ල.06)

**III - කොටස**

(08) (i) A - පෙට්රාක් B - සර් තෝමස් මුවර් C - ප්‍රංශයේ ඉරාස්මස් (ල.03)

(ii) A - පෘථිවිය ගෝලාකාර බව හා අනිකුත් ග්‍රහයන් සූර්යාවටා පරිභ්‍රමණය වන බව.

B - ගුරුත්වාකර්ෂණ නියමය.

C - සෞරග්‍රහ මණ්ඩලයේ ග්‍රහලෝක සූර්යයා වටේ ඉලිප්සාකාරව යාම.

D - දුරදක්නය නිපදවීම. (ල.04)

(iii) ● චිත්‍ර නිර්මාණයේ දී කලාකරුවන්ට අනුග්‍රහ දැක්වීමට ලෞකික රසාස්වාදය හිමි ධනවතුන් බිහිවීම.

● පුද්ගලවාදය නිසා කලාකරුවන් තම නිර්මාණ කර ගැනීමට තම නමින් ඉදිරිපත් කිරීම.

● ශ්‍රේණිවල නමින් හැඳින්වූ නිර්මාණ කලාකරුවන්ගේ නමින් ඉදිරිපත් වීම.

● ලෞකික රසාස්වාදයට මුල්තැන දීම නිසා චිත්‍රවල නිරුවත් අඩනිරුවත් චිත්‍ර බිහිවීම.

● චිත්‍ර වලට වාස්තු විෂය වෙනස්වීම, එනම් ක්‍රිස්තුන් වහන්සේ මරිය තුමිය යෙදීම වෙනුවට ධනවතුන්ගේ රූප රජ කුමර කුමරියන්ගේ රුව චිත්‍ර කරවීම වාස්තු විෂය වීම.

● ප්‍රතිමා කලාවේදී වෙනස්කම් සිදු විය. කිරි ගරුඬින් ප්‍රතිමා නෙලීම. ලොරොන්සෝ මෙඩිසි, මෝසස් ආදීන්ගේ ප්‍රතිමා නෙලීම. (ල.05)

(iv) ● <u>දේශපාලනය :-</u> යුරෝපයේ ඇතිවූ චින්තන විප්ලවය නිසා ඒවා මෙරටට ද බලපෑවේය. රාජාණ්ඩු ක්‍රමය වෙනුවට පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය ලැබීම. උඩරට සිටි නිලධාරී පෙලන්තිය වෙනුවට නව නිලධාරී පන්තියක් හා ආයතන පද්ධතියක් බිහිවීම. යුරෝපීය නීති මූලධර්ම වලට අනුකූල නීති පද්ධතියක් බිහිවීම.

● <u>ආර්ථිකය :-</u> වෙළඳාම ඉලක්ක කරමින් ලන්දේසින් කුරුඳු ද / බ්‍රිතාන්‍යයන් කෝපි, තේ, කොකෝවා වගාවට පෙළඹීම, ආනයන අපනයන ආර්ථිකයක් තිබීම, දුම්රිය, මහාමාර්ග පද්ධතියක් බිහිවීම, වෙළඳ නගර බිහිවීම.

● <u>සමාජීයිය :-</u> මුද්‍රණ කර්මාන්තය දියුණුවීම තුළින් පොත්පත් සඟරා ප්‍රදර්ශනයෙන් චින්තන විප්ලවයක් ඇතිවීම. ලාංකිකයන් යුරෝපා රටවලට ගොස් අධ්‍යාපනය ලැබීම නිසා බටහිර චින්තනය ලැබීම. විවිධ ආගමික නිකායන් මෙරටට පැමිණීම නිසා මුදුකරයේ කතෝලික ආගම ව්‍යාප්ත වීම. බටහිර අධ්‍යාපනය ප්‍රචලිත වීම. යුරෝපීය වාස්තු විද්‍යාව මෙරටට ලැබීම. (ල.06)

09 (i) ● ආර්ථික වාසි ලබා ගැනීම ● ආගම ප්‍රචාරය කිරීම ● ජාත්‍යන්තර කීර්තිය දිනා ගැනීම. (ල.03)

(ii) ● ආසියාවේ කුළු බඩු මිළ ඉහළ නැංවීම ● භාණ්ඩ හිඟයක් මතුවීම ● කලට වේලාවට භාණ්ඩ නොදීම ● භාණ්ඩ වලින් බදු අය කිරීම (ල.04)

(iii) ආසියාවට ඒමට වෙරළ මාර්ග සෙවීමේදී පෘතුග්‍රීසීන් වෙනත් ජාතීන්ට වඩා පහසුවෙන් එය කර ගැනීමට උදව් වූ කරුණු :- ● පෘතුගාලය අත්ලන්තික් සාගරයට මුහුණලා පිහිටීම නිසා සමුද්‍ර කටයුතු වලදී ඔවුන්ට තිබූ නිපුණතාවය. ● 15 සියවසේ පෘතුගාලයේ සිටි නාවික හෙන්රි දේශ ගවේෂණයේ උනන්දුවක් දැක්වූ අයෙක් වීම නිසා ඔහු නාවික විද්‍යාලයක් ආරම්භ කිරීම. එහි නාවික ශිල්පය, සිතියම් විද්‍යාව, නාවික ශාස්ත්‍රය වැනි විෂයන් ඉගැන්වීම. (ල.05)

(iv) ● සේද මාවත - කොන්ස්තන් තිනෝපල් නගරයේ සිට පර්සියාව මධ්‍ය ආසියාව හරහා චීනය දක්වා වැටී තිබූ මාර්ගය. ● කොන්ස්තන් තිනෝපලය සිට මධ්‍යධරණී මුහුද ඔස්සේ මිසරය රතු මුහුද හරහා ඉන්දියා නගරයට පැරණි මාර්ගය ● කොන්ස්තන්තිනෝපලයේ සිට බැග්ඩෑඩ් පර්සියන් බොක්ක හරහා ඉන්දියාවේ බටහිර වෙරළට පැමිණි මාර්ගය.

මෙම මාර්ග වලින් ගෙන ගිය වෙළඳ බඩු ගොඩබිමේදී තවලම් මගින් ද මුහුදු ගමන් වලදී නැව් වලින් ද ගෙන යන ලදී. මෙම භාණ්ඩ ආසියාවෙන් ගෙනගියේ මුස්ලිම් වෙළඳුන් ය. ඔවුන් කුළු බඩු යුරෝපයට දීමෙන් අධික ලාභ ලැබීය. (ල.06)